# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන
10 වැනි කාණ්ඩය
අප්‍රේල් 2021



01 දියවන්නා ඔය ජලාශයේ ජලය අපවිත්‍ර වීම පිළිබඳව ඉදිරි පියවර ගැනීම සඳහා කාර්ය සාධක බලකායක්

03 ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් වූ රෙගුලාසි කිහිපයකට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතිය

16 එළවළු හා පලතුරු අස්වනු හානියෙන් මෙරට ආර්ථිකයට වාර්ෂිකව සිදුවන අලාභය රුපියල් බිලියන 20ක්

17 සෙංකෝලයේ භාරකාරීත්වය උසුලන වේත්‍රධාරීවරයා

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



# දියවන්නා ඔය ජලාශයේ ජලය අපවිත්‍රකරණය පිළිබඳව ඉදිරි පියවර ගැනීම සඳහා කාර්ය සාධක බලකායක්

**දියවන්නා ඔය ජලාශයේ ජලය අපවිත්‍රකරණය හා අවපැහැයෙන් යුක්තව පැවැතීම පිළිබඳව ඉදිරි පියවර ගැනීම සඳහා කාර්ය සාධක බලකායක් පත් කර ඊට කඩිනම් පියවර ගන්නා ලෙස ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාට දැනුම් දී ඇත.**

දැනට උද්ගත තත්ත්වය මඟහරවාගැනීම පිණිස ක්ෂණික විසඳුම් හඳුනාගෙන, කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවද, මෙම ජලාශය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා පියවර ගැනීමට සිදුවීම හේතුවෙන් මුහුණුපෑමට සිදුව ඇති අපහසුතා මින් ඉදිරියට සිදු නොවීමේ අවශ්‍යතාවද කථානායකවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

දියවන්නා ඔය ජලාශයේ ජලය අපවිත්‍ර වීම හා අවපැහැයෙන් යුක්තව පැවැතීම පිළිබඳව කරුණු සාකච්ඡා කිරීම පිණිස ගරු කථානායකතුමාගේ සභාපතීත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැති රැස්වීමේදී ඉහත දැනුම්දීම සිදු කෙරිණි.

පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයන්ද, ආරක්ෂක අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, නාගරික සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ අධිකාරිය, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහ නගර සභාව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ඒජන්සිය (NARA) සහ ශ්‍රී ලංකා පොලීසිය යන ආයතනවල නිලධාරීහු මෙම සාකච්ඡාවට සහභාගී වූහ.

රැස්වීමේ අරමුණු පැහැදිලි කළ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා දියවන්නා ඔය ජලාශයේ වත්මන් තත්ත්වය අනුව උද්ගත ගැටලුකාරී පසුබිම හා එම තත්ත්වය කඩිනමින් යථාවත් කිරීමේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දුන්නේය.

රාජ්‍ය  හා පෞද්ගලික ආයතන, නිවාස සංකීර්ණ, කර්මාන්ත, නිවාස යෝජනා ක්‍රම ආදිය මඟින් බැහැර කරනු ලබන්නේ සම්මත ප්‍රමිතියට අනුකූලව පිරිසිදු කරන ලද ජලය පමණක් ද යන බව නිරන්තර අධීක්ෂණයට යටත් වීමේ අවශ්‍යතාවයද දසනායක මහතා පෙන්වා දී ඇත.

අනවසර පදිංචිකරුවන්ගේ නිවාස මඟින් බැහැර කරනු ලබන මළ අපද්‍රව්‍ය මඟින් සිදුවන බලපෑම වළක්වාලීමේ හා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හා දියවන්නා ජලාශයේ ගුණාත්මක බව සුරැකීම සඳහා අදාල බලතල සහිත විධිමත් වැඩපිළිවෙළක් ස්ථාපනයේ අවශ්‍යතාව, පරිසර අමාත්‍යාංශයේ ලේකම්, විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා විසින් පැහැදිලි කළේය.

දියවන්නා ඔය ජලාශය නිසි ප්‍රමිතියකින් යුතුව පවත්වාගැනීම සඳහා අදාල සියලු පාර්ශ්වයන් විසින් වඩාත් වගකීමකින් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාවද, ඉදිරි කටයුතු සඳහා විවිධ ආයතනයන්හි ප්‍රායෝගික දායකත්වය සහ විෂයානුබද්ධ විශේෂඥ දැනුමැති විද්‍යාර්ථීන්ගේ දායකත්වය ලබාගැනීමේ වැදගත්කමද මෙහිදී සාකච්ඡාවට ලක් විය.

පුවත්

# ගරු අජිත් කුමාර මාන්නප්පෙරුම මහතා අභිනව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි



**ගම්පහ මැතිවරණ කොට්ඨාසයේ, ගරු අජිත් කුමාර මාන්නප්පෙරුම මහතා ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ පසුගිය අප්‍රේල් 09 වැනිදා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයේ දිවුරුම් දුන්නේය.**

අනතුරුව හෙතෙම, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 05 ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ඉදිරියේ මන්ත්‍රී නාම ලේඛනයේ අත්සන් තැබීය. රංජන් රාමනායක මහතාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය අහෝසි වීමත් සමඟ ඇති වූ පුරප්පාඩුව සඳහා මාන්නප්පෙරුම මහතා පත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස එතුමාගේ නම සඳහන් අති විශේෂ ගැසට් පත්‍රය ඊයේ නිකුත් කෙරුණි. 2002-2009 කාල සීමාව තුළ ගම්පහ නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස කටයුතු කළ හෙතෙම 2009 - 2013 කාල සීමාව තුළ බස්නාහිර පළාත් සභාවද නියෝජනය කළේය.2015 වසරේ එක්සත් ජාතික පක්ෂය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග කොට පාර්ලිමේන්තුවට පිවිසීමටද ඔහුට හැකි විය.

2020 වසරේ පාර්ලිමේන්තු මැතිවරණයේදී හෙතෙම සමගි ජන බලවේගය නියෝජනය කරමින් ගම්පහ මැතිවරණ කොට්ඨාශයේ 05 වැනි ස්ථානයට තේරී පත් විය.

ගම්පහ සිරිකුරුස විද්‍යාලයෙන්, බණ්ඩාරවෙළ මධ්‍ය මහා විද්‍යාලයෙන් හා කොළඹ ආනන්ද විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ මාන්නප්පෙරුම මහතා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු උපාධියද හිමිකර ගෙන තිබේ.



**පුවත්**

# ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් වූ රෙගුලාසි කිහිපයකට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතිය

**ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත්වූ රෙගුලාසි කිහිපයකට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතිය හිමිවිය. ඒ අනුව, මෙරට කර්මාන්තකරුවන්ගේ හා නිෂ්පාදකයන්ගේ ඉල්ලීම පරිදි බතික් හැර වෙනත් සාරි ආනයනයට ඉඩ ලබාදීම සඳහා වූ රෙගුලාසියකට ද රජයේ මුදල් පිළිබඳව කාරක සභාවේ අනුමැතිය හිමිවිණි.**

එසේම, 2021 පෙබරවාරි මස 11න් පසු, දින 180ක ණය පහසුකම් යටතේ නාන කාමර සනීපාරක්ෂක කට්ටල ඇතුළු ඒ හා සමාන පෝසිලේන් හෝ චීන මැටියෙන් නිම කළ සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍ය ආනයනයට මෙරට කර්මාන්තකරුවන්ට ඉඩ ලැබෙනු ඇත.

කොවිඩ් තත්ත්වය හමුවේ මෙරට රුපියල අවප්‍රමාණය වළකාලීමට සහ විදෙස් සංචිත ආරක්ෂා කරගැනීමට, ආනයන සීමා පැනවීමට සිදුවුවද සමහර භාණ්ඩ පරිභෝජනය පිණිස වන දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම යන පදනම මත ආනයන හා අපනයන පාලන කොමසාරිස් ජනරාල්වරිය වන දමයන්ති කරුණාරත්න මහත්මිය විසින් නව රෙගුලාසි කිහිපයක් රජයේ මුදල් පිළිබඳව කාරක සභාව හමුවට ඉදිරිපත් කරන ලදි. ටයිල් ආනයන තහනම අඛණ්ඩව පැවතෙනු ඇති අතර ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර ප්‍රකාශ කළේ, ටයිල් ආනයනය සම්බන්ධව මෙරට පවතිනුයේ සමාගම් ත්‍රිත්වයකට සීමාවූ කතිපයාධිකාරී වෙළඳපොළ තත්ත්වයක් බවයි. කෙසේ වෙතත්, මෙහිදී සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා සිය අවධානය යොමු කළේ, ජනමාධ්‍ය වාර්තා කරන ලෙසට කිසියම් ටයිල් නිෂ්පාදන සමාගමක් සිය නිෂ්පාදන පිරිවැය අභිබවා අතිශය විශාල ලාභයක් ලබන්නේ නම් එය අවශ්‍යයෙන්ම සැලකිල්ලට ගත යුතු බවකි.

මේ නිසා ආනයන හා අපනයන පාලන නීති සැකසීමේදී හුදෙක් වෙළෙඳ අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශයට සීමා නොවී වෙළඳපොළ සම්බන්ධව දැනුමක් සහිත පර්යේෂණ අංශයක සහයෝගය සහිතව කටයුතු කිරීමේ වැදගත්කම සභාපතිවරයා මෙම කමිටු වාරයේදීද නැවතත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත අවධාරණය කළේය. මුදල් කාරක සභාවේ සාමාජික ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නලීන් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින්, නිලධාරීන් විසින් කොවිඩ් -19 නව සාමාන්‍යකරණ තත්ත්වය යටතේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයේ මෙවැනි ගැටලු සම්බන්ධ තීන්දු ගැනීම සාධාරණ නමුත් එහි වාසිය සත්‍ය වශයෙන්ම පාරිභෝගිකයා වෙත ලැබෙන්නේද, ඔවුන් විසින් කරන ඉල්ලීම් වෙළඳපොළ පවතින සැබෑ තත්ත්වය මත පදනම් වන්නේද යන්න ගවේෂණාත්මක සොයා බලා පමණක් එම තීරණවලට එළඹිය යුතු බවද සඳහන් කළේය.

එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය පනත මඟින් ගනුදෙනුකරුවන්හට වඩාත් පහසු කිරීම සඳහා අධ්‍යයනයකින් පසු ඉදිරිපත් කර තිබෙන රෙගුලාසිද රජයේ මුදල් කාරක සභාවේදී විමර්ශනාත්මකව සාකච්ඡාවට ලක්විණි.

පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මෙහිදී කාරක සභාවට හමුවට පැමිණි සිටි නිලධාරීන්ගේ අවධානයට ලක් කළේ එම නියෝග යටතේ විශේෂයෙන් ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේදී එමඟින් විදෙස් මුල්‍ය හුවමාරුව කිසියම් අවදානමකට ලක්වීම වළක්වාලීම සඳහා වඩාත් විමර්ශනශීලීව එම කාර්යයන් ඉටු කළ යුතු බවය. රජයේ මුදල් කමිටුව හමුවට පැමිණි සිටි





ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීහු මේ යෝජනාවට එකඟව වඩාත් ගවේෂණාත්මකව කටයුතු කරන බව දැනුම් දුන්හ.

පාර්ලිමේන්තුවේ දී පැවති රජයේ මුදල් කාරක සභාව සඳහා එහි සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා, රාජ්‍ය අමාත්‍ය ඩී.වී.චානක, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කුමාර වෙල්ගම, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නලීන් ප්‍රනාන්දු යන මහත්වරුන් සහභාගී වූහ.

## පුවත්

# බැටිකලෝ කැම්පස් ආයතනය රජයට පවරා ගැනීම සම්බන්ධව අවධානය

**බැටිකලෝ කැම්පස් ආයතනය රජයට පවරා ගැනීම සම්බන්ධව විශේෂ අවධානයක් යොමුව ඇති බව අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පාර්ලිමේන්තුවේදී කීවේය.**

පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය කාවින්ද ජයවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමින් අමාත්‍යවරයා පැවසුවේ එම ආයතනයට උපාධි පිරිනැමීම සඳහා අනුමැතිය ලබා දී නොමැති බවයි.

බැටිකලෝ කැම්පස් ආයතනය සතුව ඉතා වටිනා සම්පත් පවතින බවත්, ඒවා පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළවත් දක්නට නොමැති බවත් අමාත්‍යවරයා සඳහන් කළේය.

පසුගිය වසර තුළ විශ්වවිද්‍යාල සඳහා 30000ක් බඳවා ගෙන තිබෙන අතර, මෙම වසරේ 41500ක් බඳවා ගැනීමට කටයුතු කරන බවත් අමාත්‍යවරයා කීවේය.

බැටිකලෝ කැම්පස් ආයතනය සම්බන්ධව විකල්ප දෙකක් පවතින බවත්, පළමු විකල්පය වන්නේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් ලෙස එය පවත්වා ගෙන බවද ඔහු පැවසීය.

අනෙක් විකල්පය එම ආයතනය රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ලෙස පවත්වා ගෙන යාම බවද හෙතෙම පෙන්වා දුන්නේය. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට වෛද්‍ය සිසුන් 100ක් බඳවා ගෙන තිබීම සුබවාදී බව පැවසූ අමාත්‍යවරයා එම විශ්වවිද්‍යාලය සඳහා පහසුකම් ලබා දීම ඉතා වැදගත් බවද සඳහන් කළේය.





# ස්ත්‍රී - පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීම වෙනුවෙන් සිය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව මුල් වරට රැස්වේ

**ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී - පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පසුගියදා පාර්ලිමේන්තුවේදී පළමු වරට රැස්විය.**

එය රැස්වූයේ එහි සභාපතිනි ප්‍රාථමික සෞඛ්‍ය සේවා වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ ප්‍රධානත්වයෙනි.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ කාන්තාවන් විශාල ප්‍රමාණයක් පීඩාවට පත්ව ඇති ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධවද කමිටුවේ අවධානය යොමු විය. එහිදී අවධාරණය වූයේ ලංකාව තුළ ක්ෂුද්‍ර මූල්‍ය ණය නියාමනය කිරීම සඳහා වූ නියාමන අධිකාරිය නැවත බලාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය හිමිව ඇති බවයි.

තේරීම් කාරක සභාවේ කාර්යභාරය සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කිරීමද මෙහිදී සිදුවිය. ඒ අනුව රැකියා උසස්වීම් අවස්ථා සහ සේවා ස්ථානයේදී සිදු වන හිංසනයන් ඇතුළුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම පිළිබඳ කාන්තාවන්ගේ දුක්ගැනවිලි විභාග කර බැලීම කමිටුවේ මූලික කාර්යභාරය විය යුතු බවට තීරණය කරන ලදී.

වෙනස්කොට සැලකීම කාන්තාවන්ගේ සහ දැරිවියන්ගේ ජීවිත කෙරෙහි ඇතිවන ඍණාත්මක බලපෑම වැළැක්වීම පිණිස ස්ත්‍රී - පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සහතික කරමින් අදාළ නීති පරීක්ෂා කර බැලීම සහ සමාලෝචනය කිරීම මෙම කමිටුවේ තවත් කාර්යභාරයකි.

ස්ත්‍රී - පුරුෂ සමාජභාවය අරමුණු කර ගත් සැලසුම් සකස් කිරීම සහ මූල්‍ය සම්පාදනය සහතික කරලනු පිණිස අදාළ රේඛිය අමාත්‍යාංශ සහ අධිකාරීන් දිරිමත් කිරීමද කමිටුව විසින් සිදු කිරීමට නියමිතය.

ඊට අමතරව ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ සහ රාජ්‍ය, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශවල තීරණ ගැනීමේ කණ්ඩායම් තුළ, වැඩි කාන්තා නියෝජනයක් ඇති කිරීම සඳහා පෙළඹවීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම කමිටුවේ කාර්යභාරයක් වේ.

ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී - පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය දිරිමත් කිරීම ද මෙම කමිටුවේ කාර්යයක් වේ.



මෙම රැස්වීමට කාරක සභාවේ සභාපතිනිය වන ප්‍රාථමික සෞඛ්‍ය සේවා වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන රෝහිණී කවිරත්න, හරිනි අමරසූරිය, එම්. උදයකුමාර්, සිවඥානම් ශ්‍රීතරන්, රෝහණ බංඩාර සහ කමිටුවේ ලේකම් සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී කුෂානි රෝහණදීර ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

**පුවත්**

# රජයේ අමාත්‍යාංශ 05ක ලේකම්වරුන්ට සහ තානාපතිවරුන් 02 ට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය



**රජයේ අමාත්‍යාංශ 05 ක ලේකම්වරුන්ට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය හිමි වූ බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.**

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවති උසස් නිලතල පිළිබඳ කාරක සභාවේදී මෙම අනුමැතිය හිමි විය.

එහිදී වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් අනුර දිසානායක මහතාට, නාගරික සංවර්ධනය හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා, සහ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස් මහතාට මෙලෙස අනුමැතිය ලබා දී තිබේ.

එමෙන්ම වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් ජේ.එම්.හදානි ජයවර්ධන මහත්මියට සහ ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ආර්. ඒ. කේ. කේ. රණවක මහතාටද කාරක සභාවේ අනුමැතිය හිමිවිය.

මෙයට අමතරව සෞදි අරාබියේ නව තානාපතිවරයා ලෙස පී. එම්. අම්සා මහතා පත්කිරීමට විදේශ අමාත්‍යාංශය ගෙන ඇති තීරණයට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය හිමි විය.



ඒ අතරම එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මහතා ඉතාලියේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත් කර යැවීමටද අනුමැතිය හිමිවූ බව දසනායක මහතා කීවේය.

කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම කාරක සභාවේ රැස්වීමට සභානායක සහ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, අමාත්‍යවරුන් වන චමල් රාජපක්ෂ, රමේෂ් පතිරණ, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, සහ මන්ත්‍රීවරුන් වන ජෝන් සෙනවිරත්න, අනුර ප්‍රියදර්ශන යාපා සහ රිෂාඩ් බදියුදීන්, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා සහ ඩී. සිද්ධාර්තන් යන මහත්වරු ද සහභාගී වූහ.

# අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා



**විශේෂාංග**

## ජනාධිපතිවරයා පවා මුලසුන දරන අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා ගැන ඔබ දැනුවත්ද?

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාරකසභා අතර අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා පිළිබඳ නිතර අපට අසන්නට ලැබේ. අමාත්‍යවරු මුලසුන දරන අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා පිළිබඳ බොහෝ පුවත් අපට දක්නට ලැබිණි. එබැවින් මෙම උපදේශක කාරකසභාවල ආරම්භය සහ එහි කාර්යභාරය පිළිබඳ තොරතුරු ඔබවෙත ගෙන එන්නට අපි අදහස් කළෙමු.**

අමාත්‍යාංශයීය උපදේශක කාරකසභා මුලින් හැඳින්වූයේ “උපදේශක කාරකසභා” යන නමින්ය. 1978 වර්ෂයේ අප්‍රේල් මස 20 වැනි දින එවකට අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මහතා විසින් සිදුකරන ලද යෝජනාවක් මඟින් එවකට පැවති ස්ථාවර නියෝග සංශෝධනය කොට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ උපදේශක කාරකසභා ප්‍රථමයෙන් ස්ථාපනය කරන ලදී.

ඒ අනුව 1978 වර්ෂයේ ඔක්තෝබර් මස 04 වන දින පත්කරන ලද උපදේශක කාරකසභා 2015 වර්ෂය දක්වාම අඛණ්ඩව පැවතුණි. 2018 වසරේ අප්‍රේල් මස 15 වන දින සිට නව ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීමත් සමඟ උපදේශක කාරක සභා “අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා” ලෙස වැඩිදියුණු විය.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල ප්‍රධාන අරමුණ වන්නේ රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳවත් ඒවා ක්‍රියාවට නංවනු ලබන ආකාරය පිළිබඳවත් රජය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සාකච්ඡා කිරීමට උචිත වේදිකාවක් නිර්මාණය කර දීමයි. එයට අමතරව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එක් එක් අමාත්‍යාංශ හෝ ඒ යටතේ ඇති පරිපාලන ආයතන සහ නිලධාරීන් සම්බන්ධ ගැටලු ඉදිරිපත් කිරීමටද මේ තුළින් අවස්ථාව හිමිවෙයි. වෙසෙසින්ම එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලදී එම අමාත්‍යාංශයට අදාළව ස්වකීය ඡන්ද බල ප්‍රදේශය සම්බන්ධ කාරණා මතු කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මෙමඟින් අවස්ථාව උදාවී ඇත.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන උපදේශක කාරකසභා සංඛ්‍යාවක් ස්ථාපිත කළ යුතුය. මෙහි සභාපතිවරයා ලෙස

අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා කටයුතු කරයි. මීට අමතරව රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් පත්කළ වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙක් කාරක සභාවේ සාමාජිකයන් ලෙස කටයුතු කරති. මේ අනුව මේ වන විට නව වැනි පාර්ලිමේන්තුව තුළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා 30ක් ක්‍රියාත්මක වේ.



සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත්, නියෝග සහ නියමයන් යනාදිය ඉදිරිපත් කළ පසු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ගේ වැඩි අධ්‍යයනයට අවස්ථාවක් ලබා දීම සදහා අදාළ අමාත්‍යාශයේ උපදේශක කාරක සභාවට යොමු කිරීම සිදුවේ. තවද රාජ්‍ය ආයතනවල වාර්ෂික වාර්තාද අනුමැතිය සඳහා අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කෙරේ.

කාරක සභාව මසකට වරක් රැස්විය යුතු අතර රැස්වීි සති දෙකක් ඇතුළත ඊට අදාළ කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. එසේම කාරක සභාව ඉදිරියට යම් තැනැත්තකු කැඳවා ප්‍රශ්න කිරීමටද ලියකියවිලි, පොත්පත් හෝ වාර්තා සහ වෙනත් ලේඛන ගෙන්වා ප්‍රශ්න කිරීමටද බලය ඇත. ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා හෝ මහලේකම්වරයා විසින් නම් කරනු ලබන පාර්ලිමේන්තුවේ වෙනත් නිලධරයෙකු කාරක සභාවේ ලේකම් ලෙස පත් කෙරේ.

පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල කාර්යභාරය වඩාත් ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා ඒවායේ කටයුතු වඩාත් සංවාදශීලීව පැවැත්වීම පිළිබඳ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ අවධානය පසුගියදා යොමුවිය. ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේ පැවති මුදල් අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා රැස්වීමේදී මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා විය.

මේ අනුව නීති සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී ඒ පිළිබද මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට මෙන්ම ඔවුන් සමඟ වඩාත් සංවාදශීලි හා ක්‍රියාකාරී ලෙස සම්බන්ධවීමට ඉදිරියේදී මෙම උපදේශක කාරකසභා ක්‍රමය හරහා හැකියාව ලැබෙනු ඇත.

මෙම රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ලේකම් මඬුල්ල වෙනුවෙන් අදහස් දැක්වූ සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා ප්‍රකාශ කර සිටියේ මෙම උපදේශක කාරක සභා, ඒවාට ලැබී ඇති බලතල සහ වපසරිය තුළ මෙතෙක් පැවති සාම්ප්‍රදායික ක්‍රමය වන මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ජනතා ගැටලුවලට විධායකය මඟින් විසදුම් ලබා ගැනීමෙන් ඔබ්බට ගොස් වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස ඉදිරියේදී පවත්වාගෙන යාමේ හැකියාව ඇති බවයි. එසේම විධායකය සහ ව්‍යවස්ථාදායකය සමීපව කටයුතු කරන දෙමුහුන් ආණ්ඩුක්‍රමයක් අපරට තුළ පවතින පසුබිමක ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරු විධායකය සමඟ මනා සහසම්බන්ධයක් ඇති වීමටත් මෙය හේතුවන බවත් ඒ තුළින් අප පාර්ලිමේන්තුවේ මට්ටම ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව ඉහළට ඔසවා තැබීමට හැකිවන බවත් ජයතිලක මහතා පෙන්වා මෙහිදී දුන්නේය.

තවද ඇතැම් විෂය කාරණා සම්බන්ධයෙන් කාරක සභාව සාකච්ඡා කරන අවස්ථාවේදී එම විෂයට අදාළ පාර්ශව කැඳවා නිලධාරීන් සහ මහජන නියෝජිතයන් අතර වඩාත් පුළුල් සංවාදයක් පැවැත්වීමට ඇති හැකියාව සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ඡා වූ අතර වර්තමාන ලෝකයේ වෙනස්කම්වලට අවධානය යොමු කරමින් අමාත්‍යංශයීය උපදේශක කාරක සභා පවත්වාගෙන යාමේ අවශ්‍යතාව මෙහිදී ගරු අග්‍රාමාත්‍යවරයා අවධාරණය කළේය.

මේ අනුව මෙකී වෙනස්කම් සහිතව අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට සුවිශේෂි කාර්යභාරයක් ඉටුකිරීමට ඉදිරියේදී හැකියාව ලැබෙනු ඇත.

*සෞම්‍ය ඒකනායක*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**පුවත්**

# ශ්‍රී ලංකා රුසියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව සභාපතිවරයා ලෙස රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා තේරී පත්වෙයි





**ශ්‍රී ලංකා රුසියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපතිවරයා ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා තේරී පත්විය. ඒ පසුගියදා පාර්ලිමේන්තුවේදී පැවති රුසියානු ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව වැනි පාර්ලිමේන්තුව සඳහා නව නිලධාරී මඩුල්ලක් පත්කර ගැනීම වෙනුවෙන් පැවැත්වූ විශේෂ රැස්වීමේදීය.**

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා, ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති යූරි මැටරි මහතා සහ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම රැස්වීමට අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

මෙහිදී අභිනව ලේකම්වරයා වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී සාගර කාරියවසම් මහතාද උප සභාපතිවරුන් වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන මොහොමඩ් මුසම්මිල්, අරවින්ද් කුමාර් සහ වෛද්‍ය උපුල් ගලප්පත්ති යන මහත්වරුද තේරී පත්විය. මීට අමතරව භාණ්ඩාගාරික වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය අතුරලියේ රතන හිමිද, උප ලේකම් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරල මහතාද තේරී පත්විය.

ශ්‍රී ලංකාවේ කාර්මික පදනම ස්ථාපිත කිරීම සඳහා සහාය දුන් පළමු රටවල් අතර රුසියානු සමූහාණ්ඩුව සිටින බව අප අමතක නොකළ යුතු බවත් එවකට සෝවියට් සංගමයේ සහයෝගයෙන් මෙරට වානේ සංස්ථාව, ලංකා ටයර් සංස්ථාව සහ ලංකා සීනි සංස්ථාව යන කර්මාන්ත ආරම්භ කළ බවත් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මෙහිදී පැවසීය.

එසේම ශ්‍රී ලංකා රුසියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය 1998 ඔක්තෝබර් 09 වන දින ආරම්භ කරන ලද බවත්, මේ වන විට මෙරට ජ්‍යෙෂ්ඨතම දේශපාලඥයෙකු වන වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා එවකට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයාව සිටි සමයේ මෙම සංගමයේ පළමු සභාපතිවරයා ලෙස තේරී පත්වූ බවත් කථානායකවරයා මෙහිදී සිහිපත් කළේය.







**පුවත්**

# ශ්‍රී ලංකා චීන පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ධූරයට නාමල් රාජපක්ෂ මහතා පත් වෙයි





**ශ්‍රී ලංකා - චීන පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව සභාපතිවරයා ලෙස තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා තේරී පත් විය.**

කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී මැති ඇමතිවරුන් රැසකගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැති එම සංගමයේ රැස්වීමේදී මෙම පත් කිරීම සිදු විය.

පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා සහ ශ්‍රී ලංකාවේ චීන තානාපති කී. සොන්ග්හොන්ග් යන මහත්වරුන්ගේද සහභාගීත්වයෙන් පැවැති, මෙම රැස්වීමේදී ශ්‍රී ලංකා චීන පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ ලේකම් ධූරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා තේරී පත් විය.

නියෝජ්‍ය සභාපතිවරුන් ලෙස වෛද්‍ය උපුල් ගලප්පත්ති, අරවින්ද කුමාර් සහ සෙල්වම් අඩෛකලනාදන් යන මන්ත්‍රීවරුන් පත් වූ අතර, නියෝජ්‍ය ලේකම් ලෙස මොහොමඩ් මුසම්මිල් මහතාත්, භාණ්ඩාගාරික ලෙස ඉෂාක් රහුමාන් මහතාත් තේරී පත් විය.

මෙහිදී අදහස් දැක් වූ කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ශ්‍රී ලංකාව සහ චීනය අතර සබඳතා ක්‍රි. පූ. 206 වසර දක්වා දිවයන බවත්, 1957 දී නිල වශයෙන් තානාපති සබඳතා ආරම්භ වීමෙන් පසු විවිධාංගීකරණයෙන් යුත් ඉතා ගැඹුරු සබඳතාවයක් දෙරට අතර පවතින බවත් සඳහන් කළේය.

කොවිඩ් 19 වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා චීන රජය ශ්‍රී ලංකාවට ලබාදෙන ඉතා සවිමත් සහයෝගය මෙහිදී අගය කළ කථානායකවරයා ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන සඳහා ඇති ප්‍රධානතම මූලාශ්‍රය චීනය බවද සඳහන් කළේය.

බොහෝ අවස්ථාවලදී දෙරට අතර පැවැති ඉහළ පෙළේ සංචාර ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමට ඉවහල් වූ බවත්, චීන ජනාධිපති ෂී ජින්පින් මහතා වසර 2014 දී මෙරට තුළ සිදුකළ සංචාරයත්, හිටපු ජනාධිපති සහ වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා චීනයේ කළ සංචාරයත් ඊට උදාහරණ බව ද කථානායකවරයා පැවසුවේය.

එමෙන්ම 08 වැනි පාර්ලිමේන්තුව පැවැති කාලයේදී මෙරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ලබාදුන් අධ්‍යයන චාරිකා පිළිබඳව චීන රජයට ස්තුති කළ අබේවර්ධන මහතා 2016 වසරේදී මන්ත්‍රීවරයෙකු ලෙස තමන්ටද එවැනි දූත පිරිසක් සමඟ චීනයේ සංචාරය කිරීමට අවස්ථාව ලැබුණු බව සඳහන් කළේය.

මෙහිදී අදහස් දැක්වූ චීන තානාපතිවරයා, ශ්‍රී ලංකා චීන පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය නැවත පිහිටුවීමට කටයුතු කිරීම ගැන තම උණුසුම් සුබ පැතුම් පළ කළේය. මෙය ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කෙරෙන්නක් බවත්, ඉදිරියටත් ශ්‍රී ලංකාවට සහයෝගය ලබාදීමට චීනය සූදානමින් සිටින බවත් තානාපතිවරයා පැවසුවේය.

පුවත්

# වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ජපාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ධුරයට



**වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ජපාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව සභාපතිවරයා වශයෙන් පත්වූ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා එම සංගමයේ නව ලේකම්වරයා ලෙස පත් විය.**

ශ්‍රී ලංකා ජපන් පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ 09වැනි පාර්ලිමේන්තුවට අදාළ නව නිලධාරී මඩුල්ල පත්කර ගැනීම සඳහා වූ විශේෂ රැස්වීම පසුගියදා පාර්ලිමේන්තුවේ දී පැවත්විණි.

කතානායකවරයා මුලසුන හෙබවූ මෙම රැස්වීම ශ්‍රී ලංකාවේ ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එයට මැති ඇමැතිවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විශාල පිරිසක් සහභාගී වූහ.

මෙහිදී උප සභාපතිවරුන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සෙල්වරාජා ගජේන්ද්‍රන්, ජේ. සී. අලවතුවල සහ ප්‍රේම්නාත් සී. දොළවත්ත යන මන්ත්‍රීවරුන් පත් වූ අතර, භාණ්ඩාගාරික ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා පත්විය. නියෝජ්‍ය ලේකම්වරුන් ලෙස සිවඥානම් ශ්‍රීතරන් මහතා මේජර් සුදර්ශන දෙනිපිටිය මහතාත් තේරී පත්වූහ.


කොවිඩ් 19 අභියෝගය ජය ගැනීම සඳහා අවශ්‍ය වන නවීන තාක්ෂණයෙන් යුතු වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 1360ක ආධාරයක් ශ්‍රී ලංකාවට ලබා දීම පිළිබඳව ජපාන රජයට ගරු කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සිය කෘතවේදීත්වය පළ කර සිටියේය.

ශ්‍රී ලංකාව සහ ජපානය අතර මුලින්ම ද්විපාර්ශවීය සම්බන්ධතා ගොඩ නැගුණේ ආගමික සහ සංස්කෘතික ක්ෂේත්‍රයන් හරහා බවත් නමුත් පසු කාලීනව වඩාත් වටිනා දේශපාලන හා ආර්ථිකමය සබඳතා ලෙස එය වර්ධනය වූ බවත් මහින්ද යාපා අබේවර්ධන මහතා පැවසීය.



විශේෂාංග

# බ්‍රිතාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ ගමන් මඟ



**ලොව කවර රටක වුව ද පාර්ලිමේන්තුව හැඳින්වෙනුයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ උත්තරීතරම ස්ථානය යනුවෙනි. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රජාතන්ත්‍රවාදයේ සිට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය දක්වා පැමිණි ප්‍රජාතන්ත්‍රවාදය කරා ඒ ගමන එක් පුද්ගලයෙකුගේ හෝ එක් කණ්ඩායමක පමණක් හුදෙකලා වෑයමක ප්‍රතිඵලයක් නොවේ. එය දීර්ඝ ගමන් මඟක ප්‍රතිඵලයකි. අප මේ ලිපි මඟින් සංවාදයට ලක් කරන්නේ එම ගමන් මඟ තුළ වන සන්ධිස්ථානයි.**

පුරාතන ග්‍රීසියේ ප්‍රභවය ලත් සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පසුව නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ලෙස වර්ධනය වූයේ 13,14 සහ 15 වැනි ශත වර්ෂයන්හි එංගලන්තය කේන්ද්‍ර කර ගනිමිනි. ඒ අනුව බලන කල ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවද ගුරු කොට ගන්නා මහා බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව එහි වර්තමාන ස්වරූපයට පත්වීමට වසර 1400ක තරම් දිගු කාලයක් ගත වී ඇත. එය දීර්ඝකාලීන, සාමූහික දේශපාලනික ක්‍රියාවලීන් ගණනාවක ප්‍රතිඵලයකි.

අධ්‍යයනයේ පහසුව පිණිස බ්‍රිතාන්‍ය ව්‍යවස්ථා පරිණාමය එහි සිදු වූ වැදගත් සිදුවීම්කරණ කොටගෙන ප්‍රධාන යුග හයකට බෙදනු ලැබෙයි.

- ඇන්ග්ලෝ සැක්සන් යුගය
- නෝමන් යුගය
- ඇන්ගවින් (ප්ලැන්ට ජෙනට්) යුගය
- ස්ටුවර්ට් යුගය
- හැනෝමර් යුගය

**ඇන්ග්ලෝ සැක්සන් යුගය**


වර්ෂ හයසියයක පමණ කාලයක් පැවති මෙම යුගය නූතන පාර්ලිමේන්තු ක්‍රමයේ මූලාරම්භය විණි. මෙම යුගයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ද්වය වන්නේ, කුඩා ප්‍රාන්ත පාලකයන් එක් බලවත් ප්‍රාන්ත පාලකයකුට යටත් වීම නිසා රාජ්‍යත්වය බිහිවීමත්, පළාත් පාලන ආයතන බිහිවීමත්ය. රජුට උපදෙස් දීම පිණිස ගිහි - පැවිදි ප්‍රභූන්ගෙන් සමන්විත වැඩිහිටි බුද්ධි මණ්ඩලයක් (විටෑනමෝ සභාව) වීම තවත් විශේෂත්වයකි.

**නෝමන් යුගය**

බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාවේ පරිණාමයට අදාළ වන කරුණු රැසක් මෙම යුගයට අදාළ වේ. නිදර්ශනයකට, ප්‍රිවි කවුන්සිලය, කැබිනට් මණ්ඩලය සහ මහා භාණ්ඩාගාරයේ මුල් ස්වරූප ඇති වූයේ ක්‍රි.ව.1066න් ඇරඹි මෙම යුගයේදීය. නෝමන්ඩි හි විලියම් 1066 දී එංගලන්තය යටත් කරගත්තේය. ඉන් පසුව හෙතෙම, වැඩිහිටි බුද්ධි මණ්ඩලය විසුරුවා හැර නව මණ්ඩලයක් පත් කරගත්තේය. රජුගේ සභායට සිටි එම කුඩා මඬුල්ල කියුරයා රෙජිස් නම්, එනමුත් එහි උපදෙස් පිළිපැදීමට රජු බැඳී සිටියේ නැත. එයින් රජු ගේ බලයෙහි කිසියම් වර්ධනය වීමක්ද නෝමන් යුගයේදී දක්නට ලැබිණ.


**ඇන්ගවින් (ප්ලැන්ට ජෙනට්) යුගය**

ප්‍රජාතන්ත්‍රවාදය හා මිනිස් අයිතිවාසිකම් පිළිබඳව කරන ඕනෑම කතිකාවකදී නිසැකවම ඇන්ගවින් (ප්ලැන්ට ජෙනට්) යුගයේ බිහිවූ මැග්නාකාර්ටා ගිවිසුම අවධානයට ලක්වෙයි. එය බ්‍රිතාන්‍යයේ පමණක් නොව



Magna Carta of King John, AD 1215





මුළු මහත් ලෝකයේද ව්‍යවස්ථා පරිණාමයේ එක් සුවිශේෂී කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකෙන්නේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳව වැදගත් වන ඓතිහාසික අවස්ථාවන්ගෙන් එකක් වන හෙයිනි. ප්ලැන්ට ජෙනට් යනු එංගලන්ත රාජ වංශයකි.

ක්‍රි.ව. 1215 දී ප්‍රකාශයට පත් වූ මැග්නා කාර්ටා ගිවිසුම, වත්මන් ප්‍රජාතන්ත්‍රවාදී අරගලයේ අයිතිවාසිකම් පිළිබඳව අවධානය යොමු වූ ප්‍රථම අවස්ථාව ලෙසද හැඳින්විය හැකියි.මහා ගිවිසුම යන අර්ථය දෙන මෙම ගිවිසුම, එංගලන්තයේ ජෝන් රජතුමා සහ රදළයන් අතර ඇති කරගත්තකි. 1213 දී පමණ එංගලන්තයේ ජෝන් රජු මුහුණ දුන් දේශපාලන අර්බුදය සඳහා විසඳුමක් වශයෙන් අත්සන් කළ මෙම ගිවිසුම මඟින් රජුද ඇතුළුව සෑම පුද්ගලයෙකුම එක් නීතියකට යටත් වන බව තහවුරු කෙරේ.

පුරාණ බ්‍රිතාන්‍යයේ බලය බෙදී ගියේ ප්‍රධාන ආයතන ත්‍රිත්වයක් අතරේය. ඒ බලය බෙදී යාම පිළිවෙළින් රජු, කතෝලික පල්ලිය සහ රදළ පැළැන්තිය අතරේ සිදු කෙරුණකි. මේ වන විට ජෝන් රජු, පල්ලිය හා වංශාධිපතින් අතර බලය සම්බන්ධව අර්බුදයක් නිර්මාණයව තිබුණෙන්, බලය ක්‍රමයෙන් හීන වූ රජුහට වංශාධිපතීන්ගේ ගිවිසුමට එකඟ වීමට සිදුවිය. ඒ නැතහොත් රජුට විරුද්ධව යුද ප්‍රකාශ කරනු ඇතැයි බියෙනි. ජෝන් රජු අකුරු නොදත් නිසා හෙතෙම එම ලේඛනය මත මුද්‍රාවක් තැබීය.

ක්‍රි.ව. 1254 තෙවන හෙන්රි රජු බදු අය කිරීමේ ප්‍රශ්නයක් මත සිටුවරුන් හා ගැටුමක් ඇති කරගත්තේය. ලද අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලද වංශාධිපතිහු සිය නායකයෙක් පත් කරගෙන 1265 දී පළමුවන පාර්ලිමේන්තුව නොහොත් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් කැඳවූහ. ක්‍රි.ව. 1295දී එඩ්වඩ් රජු බදු සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාන්‍ය මහජන නියෝජිතයන්ගෙන්ද යුතු පහත කණ්ඩායම් තුනට ආරාධනා කළේය.

1) රජු සමඟ පූජකවරු කණ්ඩායම
2) රජු සමඟ, රදළයන්ගේ කණ්ඩායම
3) මහජන නියෝජිත කණ්ඩායම

මෙම කණ්ඩායම් ත්‍රිත්වය පසුව කොටස් දෙකක්ව මණ්ඩල දෙකක් බවට පත්වූයේ මුල් කණ්ඩායම් දෙකෙහි අදහස් එක හා සමානව ගැළපීමෙනි. එය ද්වි මණ්ඩල ක්‍රමයෙහි ආරම්භය ද විය. මුල් මණ්ඩල ද්වයේ එකතුව හැඳින්වූයේ සාමි මන්ත්‍රී මණ්ඩලය ලෙස හැඳින්විණි. අනෙක් මහජන නියෝජිත කණ්ඩායම, මහජන මන්ත්‍රී මණ්ඩලය හෙවත් අද බහුලව ව්‍යවහාරයෙහි යෙදෙන House of Commons නම් විය.



*එන්. එච්. එම්. ජානක*
*ආහාර හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව*

**පුවත්**

# ආනයනික ආහාර වල අඩංගු හානිකර ද්‍රව්‍ය පිළිබඳව පුළුල් පරීක්ෂණයක් - රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් උපදෙස්



**පොල්තෙල් වැනි මෙරට ආනයනය කරනු ලබන ආහාර වර්ග ඇතුළු ආහාරවල හානිකර ද්‍රව්‍ය පිළිබඳව පරීක්ෂා කිරීමේ බලය පවතින්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට බවත් එබැවින් ආහාරවල ඇති හානිකර ද්‍රව්‍ය පිළිබඳව පුළුල් පරීක්ෂණයක් පැවැත්වීමට වහා කටයුතු කරන ලෙසත් රජයේ ගිණුම් කාරක සභාව සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන්ට දැනුම් දුන්නේය.**

ආහාර පරීක්ෂාව සඳහා රසායනාගාර පහසුකම් වැඩිදියුණු කළ යුතු අතර රටේ ආහාර සුරක්ෂිතතාවයට අදාළ නීති කඩිනමින් සංශෝධනය කළ යුතු බවද රජයේ ගිණුම් කාරක සභාවේ සභාපති මහාචාර්ය තිස්ස විතාරණ මහතා නිලධාරීන්ට දැනුම් දුන්නේය.

ආහාර පරීක්ෂා කරන රසායනාගාර අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීම හේතුවෙන් පවතින තත්ත්වය උග්‍රවී ඇති බව ගිණුම් කාරක සභාවේ හිටපු සභාපති රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

රටේ අහාර සුරක්ෂිතතාව වෙනුවෙන් නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වර්තමානයේදී ගැටලු රැසක් උද්ගතව පවතින බව 2017/2018 වසරවල සෞඛ්‍ය අමාත්‍යාංශයේ විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය පිළිබඳ සොයා බැලීමට පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අවධානය යොමු විය.

මෙරටට ආනයනය කරන රූපලාවණ්‍ය ද්‍රව්‍යවල ශරීරයට ඉතාම අහිතකර රසායනික ද්‍රව්‍ය අඩංගු බව පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය පැවසුවාය. රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීමේ දී නිසි නියාමන ක්‍රමවේදයක් සැකසීම ඉතා වැදගත් බව කාරක සභාවේ මතය වූ අතර, ඒ සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින්ට උපදෙස් දුන්නේය.

ආහාර සඳහා බලාත්මක වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති රීති බැවින් ආහාර වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා කඩිනමින් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතා මෙහිදි අවධාරණය කළේය.

මෙම කාරක සභාවට තිස්ස අත්තනායක, නිරෝෂන් පෙරේරා, වෛද්‍ය උපුල් ගලප්පත්ති, වීරසුමන වීරසිංහ යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළු නිලධාරිහු පිරිසක් සහභාගී වූහ.

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ සංයුක්ත සැලැස්ම ප්‍රකාරව වසර 05ක් වූ ව්‍යාපෘති කාලය තුළ නව සොයාගැනීම් සඳහා සලසා තිබුණු සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 346ක් වූ නමුත්, 2017 දෙසැම්බර් 3 දින වන විට නව සොයා ගැනීම් පර්යේෂණ යෝජනා 34ක් වෙත රුපියල් මිලියන 399ක් අනුමත කර තිබීම සම්බන්ධයෙන් කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

නව සොයාගැනීම් ව්‍යාපෘති කිහිපයක් එකම පුද්ගලයෙකු විසින් සිදු කිරීම පර්යේෂණ ව්‍යාපෘති අකාර්යක්ෂම වීමට බලපා තිබෙන බවද කාරක සභාවේදී හෙළි විය.

කළුබෝවිල දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ මහල් 07කින් යුක්ත මිලේනියම් වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 398ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2006 අගෝස්තු 14 වැනි දින පුද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණ අතර



සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා නව ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 3,896ක බදු සහිත කොන්ත්‍රාත් වටිනාකමට CECB වෙත 2014 ඔක්තෝම්බර් මස 29 වැනි දින ප්‍රදානය කර තිබූ අතර, ඉදිකිරීම් කටයුතු ඇරඹීමට පෙර ගොඩනැගිලි සැලැස්මට මහනගර සභාවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණු බවත්, ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක්ද සිදුකර නොතිබූ බවත් කාරක සභාවේදී අනාවරණය විය.

2008 මාර්තු 19 වැනි දින එහි වැඩ නිමකළ යුතු වුවද, 2014 මාර්තු 06 වැනි දින වන විටත් වැඩ නිමකර නොතිබුණු බැවින් එදින සිට කොන්ත්‍රාත්කරුගේ වැඩ අවසන් කර තිබූ බව කාරක සභාවේදී නිරීක්ෂණය විය.

එදින වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු මුදල රුපියල් මිලියන 51ක් ආපසු අයකර ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධව කාරක සභාවේ විශේෂ අවධානයක් යොමු විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස කාරක සභාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දුන්නේය.

2006 වසරේදී අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 3171ක් වැයකර මිලදී ගෙන තිබුණු ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර 224ක් වසර 15කට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව තබා තිබීම සම්බන්ධයෙන් කාරක සභාව සිය නොසතුට පළ කළේය.

## පුවත්

# පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ජීවිතක්ෂයට පත් වූ පාර්ශ්ව සිහිකිරීම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවක්

***පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ජීවිතක්ෂයට පත් වූ පාර්ශ්ව වෙනුවෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා කළ ඉල්ලීමකට අනුව විනාඩියක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීමට ආණ්ඩු පක්ෂයත් විරුද්ධ පක්ෂයත් පාර්ලිමේන්තුවේදී අප්‍රේල් 21 වැනිදා කටයුතු කළේය.***

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුව ආරම්භයේදී පාස්කු දින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර පිළිබඳව විශේෂ ප්‍රකාශයක් සිදු කිරීමෙන් අනතුරුව, ජීවිතක්ෂයට පත් වූ සියලු දෙනා සිහි කිරීම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවක් පැවැත්විය යුතු බවට කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගෙන් ඉල්ලීමක් කළේය.

ඒ අනුව විනාඩියක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීමට පාර්ලිමේන්තු සභා ගර්භයේ සිටි සියලු මැති ඇමතිවරු සහ මන්ත්‍රීවරු කටයුතු කළහ.

**පුවත්**

# එළවළු හා පලතුරු අස්වනු හානියෙන් මෙරට ආර්ථිකයට වාර්ෂිකව සිදුවන අලාභය රුපියල් බිලියන 20ක්



**ජාතික විගණන කාර්යාලය 2015 දී සිදු කළ විගණනයකට අනුව වාර්ෂිකව එළවළු හා පලතුරු මෙට්‍රික් ටොන් 270,000 පමණ අපතේ යන බවත් එයින් මෙරට ආර්ථිකයට සිදුව ඇති අලාභය රුපියල් බිලියන 20ක් පමණ වන බවත් පසුගියදා පාර්ලිමේන්තුවේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ සභාපතිත්වයෙන් පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය.**

එම වාර්තාවේ නිරීක්ෂණ අනුව, ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරුවල පසු අස්වනු හානිය සියයට 30-40ත් අතර ප්‍රමාණයක් බව අනාවරණය වී තිබේ.

මෙරට වැඩිහිටියන්ගෙන් 73%ක් පමණ ප්‍රමාණවත් පරිදි එළවළු හා පලතුරු පරිභෝජනය නොකරන අතර, වයස අවුරුදු 5ට වඩා අඩු දරුවන් ගේ මන්දපෝෂණ මට්ටමද 21% පමණ වන බව තවදුරටත් මෙම වාර්තාව මඟින් හෙළිදරව් වී තිබේ.

එමෙන්ම කෘෂිකර්මයේ සමස්තය ආවරණය වන පරිදි සකස් කළ සම්මත කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට නොමැති බවද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය. 2019 දී අවසන් වරට සකස් කර ඇති දේශීය කෘෂිකාර්මික ප්‍රතිපත්තියද මේ වන විට පවතින්නේ කෙටුම්පත් මට්ටමේ බවත්, දේශීය හා විදේශීය වෙළඳ පොළ ඉලක්ක කරගත් කෘෂිකාර්මික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිළිබදවද කෝපා කමිටුවේ අවධානයට ලක්විය.

ඉහත කරුණු අනාවරණය වූයේ ශ්‍රී ලංකාවේ එළවලු හා පලතුරු සම්බන්ධව පසු අස්වනු හානිය අවම කිරීම හා සාධාරණ මිලට අලෙවිය සඳහා අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ වූ කාර්ය සාධන විගණන වාර්තාව සාකච්ඡාවට ලක් කළ අවස්ථාවේදීය.

එසේම, මෙම කමිටුවේ සාමාජිකයින්ගේ අවධානය යොමු වූ තවත් වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ, දේශීය ගොවියා සහ පාරිභෝගිකයන් යන දෙපාර්ශවයටම ගැටලුවක් වන අතරමැදියන්ගේ අසීමිත ලාභ ඉපයීම වැළැක්වීමට සහ මෙරට එළවළු හා පලතුරු පසු අස්වනු හානිය අවම කිරීම මෙන්ම කෘෂි නිෂ්පාදන සාධාරණ මිලට අලෙවි කිරීම සඳහා කඩිනම් වගා සැලැස්මක අවශ්‍යතාවයයි.

මෙහිදී ශ්‍රී ලාංකිකයන්ගේ ආහාර ඉල්ලුම සපුරාලීමට දිවයිනම ආවරණය වන පරිදි සකස් කරන ලද පුළුල් වගා සැලැස්මක් නොමැති වීම හේතුවෙන් ගොවීන් ඔවුන්ගේ රුචිකත්වය පරිදි වගා කටයුතු වල නියැළීම නිසා ඇතැම් බෝග වල අතිරික්ත අස්වැන්නක් ඇතිවීමෙන් අස්වනු හානියට හේතුවක් වී ඇති බවද කෝපා කමිටුවේ සාමාජිකයින් ගේ අවධානයට යොමු විණි.

ශ්‍රී ලංකාවේ ගොවියා මෙන්ම පාරිභෝගිකයන්ද එක සේ ආරක්ෂා කෙරෙන සම්මත කෘෂි ප්‍රතිපත්තියක් පිළිබඳව විශේෂ අවධානයක් යොමු වූ මෙම කාරක සභාවට සභාපති මහාචාර්ය ගරු තිස්ස විතාරණ මහතා, රාජ්‍ය අමාත්‍යවරුන් වන ගරු දුමින්ද දිසානායක මහතා, ගරු දයාසිරි ජයසේකර මහතා, ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය, ගරු ලසන්ත අලගියවන්න මහතා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම උසස් නිලධාරීහු පිරිසක්ද සහභාගී වූහ.

# වේත්‍රධාරීවරු





නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා
වේත්‍රධාරීවරයා



කුෂාන් සම්පත් ජයරත්න මහතා
නියෝජ්‍ය වේත්‍රධාරීවරයා



අචින්ත ශ්‍රීමාල් කුරේ මහතා
සහකාර වේත්‍රධාරීවරයා





# සෙංකෝලයේ භාරකාරීත්වය උසුලන වේත්‍රධාරීවරයා

**කථානායකවරයාගේ නියෝග අනුව පාර්ලිමේන්තුවේ විනය පරිපාලනය කරන නිලධාරියා වන්නේ වේත්‍රධාරීවරයායි. එසේම පාර්ලිමේන්තු බලාධිකාරියේ සංකේතය වන සෙංකෝලයේ භාරකාරීත්වය දැරීම සහ පාර්ලිමේන්තු සංකීර්ණයේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම වෙනුවෙන් කැපවන්නේ ද පාර්ලිමේන්තුවේ වේත්‍රධාරීවරයායි.**

වේත්‍රධාරීවරයා වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන අතර නියෝජ්‍ය වේත්‍රධාරීවරයා, සහකාර වේත්‍රධාරීවරයා ප්‍රමුඛ 140ක පමණ කාර්ය මණ්ඩලයකින් මෙම දෙපාර්තමේන්තුව සමන්විත වේ. පාර්ලිමේන්තුවේ ඇති දෙපාර්තමේන්තු අතරින් දෙවන පැරණිතම දෙපාර්තමේන්තුව වේත්‍රධාරී දෙපාර්තමේන්තු වන අතර වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු සම්බන්ධයෙන් වගකිවයුත්තා වන්නේ වේත්‍රධාරීවරයායි.

එසේම, පත්කිරීමේදී නම සභාවේ නිවේදනය කිරීම සහ විශ්‍රාම යාමේදී සුබපැතීම සභාවේදී සිදුකරන නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරියෙක් වන්නේද වේත්‍රධාරීවරයායි.

වේත්‍රධාරී ධුරය නිල වශයෙන් ආරම්භ වීම බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ඉතිහාසයේ මුල් අවධිය දක්වා විහිද යන්නකි. ශ්‍රී ලංකාවේ ප්‍රථම වේත්‍රධාරීවරයා පත් කරනු ලැබුවේ 1947 වර්ෂයේදීය. එම්. ඉස්මයිල් මහතා මෙරට ප්‍රථම වේත්‍රධාරියාවරයායි. ජේ. ආර්. ද සිල්වා, රොනී අබේසිංහ, විජය පල්ලියගුරුගේ, අනිල් පරාක්‍රම සමරසේකර යන මහත්වරු මේ දක්වා වේත්‍රධාරී තනතුරෙහි සේවයකර ඇති අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වර්තමාන වේත්‍රධාරීවරයා වන්නේ නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතායි. එසේම නියෝජ්‍ය වේත්‍රධාරීවරයා කුෂාන් සම්පත් ජයරත්න මහතා වන අතර සහකාර වේත්‍රධාරීවරයා වන්නේ අචින්ත ශ්‍රීමාල් කුරේ මහතායි.

සෙංකෝලයේ භාරකාරීත්වය වේත්‍රධාරීවරයා සතු වන අතර පාර්ලිමේන්තු සභා ගර්භයේ කටයුතු ආරම්භ කිරීමේ දී සෙංකෝලය සභා ගර්භයෙහි තැන්පත් කළ යුතු වේ. එසේම සභාව රැස්වන සෑම අවස්ථාවකම සෙංකෝලය අත්‍යවශ්‍යම අංගයක් බවට පත්වේ. මෙම සෙංකෝලය 1949 වර්ෂයේ දී මහා බ්‍රිතාන්‍යයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවට ත්‍යාග කරන ලද්දකි.

සභාව තුළ දී මූලාසනය විසින් දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කරනු ලබන්නේ වේත්‍රධාරීවරයායි. යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ බලයට අවනත නොවන අවස්ථාවලදී ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට ස්ථාවර නියෝග වලින් ලබා දී ඇති විධිවිධාන අනුව ක්‍රියාත්මක වීමට ගරු කථානායකවරයාගේ නියෝග ප්‍රකාරව වේත්‍රධාරීවරයාට බලය හිමිවී තිබේ. එසේම අනුචිත ඇඳුමකින් සැරසී පාර්ලිමේන්තුවේ සභා ගර්භයට ඇතුළු වන ඕනෑම මන්ත්‍රීවරයෙකුට ඉන් ඉවත් වන ලෙස ඉල්ලා සිටීමට වේත්‍රධාරීවරයාට හැකියි. පාර්ලිමේන්තු වරප්‍රසාද සම්බන්ධයෙන් කථානායකවරයා දෙන නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද වේත්‍රධාරීවරයාට ප්‍රධාන වශයෙන් වගකීම පැවරී තිබේ. පාර්ලිමේන්තු රැස්වීම් දිනවලදී නීතිවිරෝධී අයුරින් පාර්ලිමේන්තු පරිශ්‍රයට ඇතුලුවීමට උත්සාහ දරන පුද්ගලයින් සහ බාධාකරන පුද්ගලයින් වරෙන්තුවකින් තොරව අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමට පාර්ලිමේන්තු බලතල සහ වරප්‍රසාද පනත අනුව වේත්‍රධාරීවරයාට බලය හිමිවේ. පාර්ලිමේන්තුව රැස්වන සාමාන්‍ය දින වලදී සුදු පැහැති නිල ඇඳුමකින් වේත්‍රධාරීවරයා සැරසී සිටින අතර උත්සව අවස්ථාවලදී කළු පැහැති උත්සවීය නිල ඇඳුමකින් සැරසී සිටී. එසේම තම ඇඳුමේ කොටසක් වශයෙන් ආයුධයක් සහා ගර්භය තුළට රැගෙන යා හැකි එකම පුද්ගලයා වන්නේ ද වේත්‍රධාරීවරයායි. සභාගර්භය තුළ ප්‍රධාන ද්වාරය අසල විශේෂ අසුනක් වේත්‍රධාරීවරයා වෙනුවෙන් වෙන්කර තිබේ.

පාර්ලිමේන්තු සංකීර්ණයේ ආරක්ෂාව තහවුරු කිරීමේ දී පොලීසිය ත්‍රිවිධ හමුදාව සහ බුද්ධි අංශ වල සහාය ලබාගෙන ඒ හා සම්බන්ධ වී කටයුතු කිරීම ද වේත්‍රධාරී සිදු කරයි.

පාර්ලිමේන්තුවේ නව සභාවාර උත්සවාකාරයෙන් විවෘත කිරීම ඇතුළු විදේශීය රාජ්‍ය නායකයින් පාර්ලිමේන්තුව ඇමතීම හා සම්බන්ධ උත්සව සංවිධානය කිරීම, රාජ්‍ය අවමංගල උත්සව සංවිධානය කිරීම ආදී උත්සව අවස්ථාවන් සංවිධානය කිරීමේ වගකීම ද වේත්‍රධාරී සතුවේ.

පාර්ලිමේන්තුවේ සභාගර්භය රැස්වීම් පැවැත්වීමට උචිත ආකාරයෙන් සූදානම් කිරීම, පාර්ලිමේන්තු සංකීර්ණයේ මහජන හා විශේෂ අමුත්තන්ගේ ගැලරි පාලනය කිරීම, පාර්ලිමේන්තු අවසරපත්‍ර අවශ්‍ය පුද්ගලයින් වෙත නිකුත් කිරීම ආදී කටයුතු ඉටු කිරීමද වේත්‍රධාරී විසින් ඉටුකරනු ලබයි.

මේ ආකාරයෙන් පාර්ලිමේන්තුවේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට මහඟු සහායක් වේත්‍රධාරී දෙපාර්තමේන්තුවෙන් ලැබේ.

*ආසිරි හපුගොඩ*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**පුවත්**

# පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයෝ මෙවරත් දන්ත ධාතූන් වහන්සේ උදෙසා මුල්තැන් පූජාව පවත්වති







**ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ සේ සැලකෙන, කන්ද උඩරට මහනුවර දළදා මන්දිරයෙහි තැන්පත් කර ඇති ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ උදෙසා සෑම වසරකම අප්‍රේල් මස 29 සහ 30 දෙදින සිදු කරන්නා වූ මුල්තැන් පූජාව මෙම වසරේද ඉතාමත් ගෞරව සම්ප්‍රයුක්තව සිදු කෙරිණි.**

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේද, නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතාගේද, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතාගේද උපදෙස් හා මඟපෙන්වීම මත පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය බෞද්ධ සංගමය මගින් අප්‍රේල් මස 29 වැනි දින සවස ගිලන් පස පූජාව පැවැත්විණ.

30 වැනි දින දහවල් දන්ත ධාතූන් වහන්සේ උදෙසා මුල්තැන් පූජාව පැවැත්වීමටද කටයුතු කෙරිණි. සංඝගත දක්ෂිණාව ඉන් අනතුරුව පැවැත්විණ. නුගේගොඩ නාවල පදිංචි උදේනි මුතුකුඩ මහත්මියද මෙම පිංකම සඳහා දායකත්වය සැපයීය.

පුවත්

# මුතුරාජවෙල අභය භූමිය ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීමට පියවර



**මුතුරාජවෙල අභය භූමිය ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීමට කිරීම සඳහා මේ වන විට කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කොට ඇති බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සඳහන් කළේය.**

ඒ මහතා මේ බව සඳහන් කළේ මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදීය.

එමෙන්ම කෝපා කමිටුව මඟින් පෙර රැස්වීමේදී නිර්දේශ කළ පරිදි මුතුරාජවෙල අභයභූමිය සංරක්ෂණය කිරීම සඳහා වගකිවයුතු සියලු පාර්ශවයන්ගෙන් සැදුම් ලත් ඒකාබද්ධ කමිටුවක් පත්කර ඇති බවද ජාසිංහ මහතා සඳහන් කළේය. එම කමිටුව නාගරික සංවර්ධන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය සහ වනජීවී අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ සම සභාපතිත්වයෙන් යුතුව ක්‍රියාත්මක වන බවද එහිදී සඳහන් විය.



එම කමිටුව බලාත්මක කිරීම සඳහා මේ වන විට සාකච්ඡා පවත්වා කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කොට ඇති අතර එය අනුමත වීම සමඟ ක්‍රියාත්මක වීම ආරම්භ කළ හැකි බවත්, එම කමිටුවට සහාය වීම සඳහා අදාල සියළු ආයතන සහ පරිසර සංවිධානවල නියෝජිතයන්ගෙන් සමන්විතව ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම අත්‍යාවශ්‍ය බවද මෙහිදී අවධාරණය විය.

2021 ජනවාරි 27 වැනිදා බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් මුතුරාජවෙල අධි සංවේදී පරිසර කලාපයේ සියළු පෞද්ගලික ඉඩම් අක්කර 600ක් රජයට පවරා ගන්නා බවට, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී යෝජනා සම්මත කර තිබීම පිළිබඳව මෙහිදී කෝපා කමිටුවේ අවධානය යොමු වූ අතර එහි නීත්‍යානුකූලභාවය පිළිබඳව සාකච්ඡා කෙරිණි.

මුතුරාජවෙල පරිසර කලාපයට අයත් ඉඩම් අනවසරයෙන් ගොඩකිරීම සම්බන්ධව පැමිණිලි රාශියක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම

පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආදී ආයතන වෙත ලැබුණද ඒවා සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක් විය.

මුතුරාජවෙල තෙත්බිම් කලාපය තුළ අනවසර ඉදිකිරීම් පිළිබඳ ලැබෙන පැමිණිලි අදාළ රාජ්‍ය ආයතන මඟින් නිසි පරිදි විමර්ශනයට ලක් නොවීම පිළිබඳ විගණකාධිපතිවරයාගේ අවධානය යොමු වූ අතර, මෑතකදී එලෙස හෙක්ටයාර 06ක් ගොඩ කිරීම සම්බන්ධව විගණන විමසුමක් දැනටමත් පවතින බවත් මෙලෙස රාජ්‍ය ආයතන නිසි පරිදි මැදිහත් නොවීම තුළ අනවසර ගොඩ කිරීම් සහ ඉදි කිරීම් වලට අනුබල දීමක් සිදුවන බවද අවධාරණය විය.

1990 ඔක්තෝබර් 15 දින ශ්‍රී ලංකාව එළැඹි රැම්සා සම්මුතියට අනුව මුතුරාජවෙල තෙත් බිම් කලාපය රැම්සා තෙත්බිමක් ලෙස ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම සහ එය ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීමත් පිළිබඳව කමිටුවේ අවධානය යොමු වූ අතර නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් සංවර්ධන සංස්ථාව සහ වනජීවී දෙපාර්තමේන්තුව යන ආයතන එක්ව ඒ සඳහා කටයුතු කිරීමේ ශක්‍යතාවය සහ වැඩපිළිවෙල පිළිබඳව මෙහිදී නිලධාරීහු පෙන්වා දුන්හ.

මෙම රැස්වීමට කමිටුවේ සභාපති මහාචාර්ය තිස්ස විතාරණ, රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන තිස්ස අත්තනායක, බී.වයි.ජී. රත්නසේකර, වෛද්‍ය උපුල් ගලප්පත්ති, හරිනි අමරසූරිය සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම් අනිල් ජාසිංහ ඇතුළු අමාත්‍යාංශ සහ ආයතන 16ක නිලධාරීන් සහ මුතුරාජවෙල සුරැකීමේ සිවිල් සංවිධාන නියෝජිතයන් පිරිසක්ද සහභාගී වූහ.

# එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ-ව්‍යවස්ථාදායක සේවා තනතුරට



**එච්.ඊ. ජනකාන්ත සිල්වා මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා තනතුරට පත් කර තිබේ. ඔහු අවසන් වරට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ( පරිපාලන) තනතුරේ කටයුතු කළේය.**

1990 ජනවාරි මාසයේදී ලිපිකරුවෙකු ලෙස පාර්ලිමේන්තු සේවයට එක් වූ එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා රෝමයේ උර්බානු විශ්ව විද්‍යාලයෙන් දර්ශනවාදය පිළිබඳ උපාධිය හිමිකරගෙන තිබේ.
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය (Constitutional Law) සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් හා පරිචයන් පිළිබඳ ඩිප්ලෝමා දෙකක්ද, පාර්ලිමේන්තු ව්‍යවස්ථා සම්පාදනය (Legislative Drafting) පිළිබඳ විශේෂ නේවාසික පුහුණු පාඨමාලාවක්ද, පිළිවෙළින් ඉන්දියාවේ ICPS සහ BPST යන ආයතනවලින් ඔහු ලබාගෙන ඇත.

ඊට අමතරව, ස්වීඩනය, චීනය, එංගලන්තය, කැනඩාව යනාදී රටවලදී විශේෂ වෘත්තීමය පුහුණු පාඨමාලාවලටද සහභාගී වී වසර 31ක පාර්ලිමේන්තු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ජනකාන්ත සිල්වා මහතා ඉන් වසර 24ක කාලයක්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ සේවය කර තිබීම විශේෂත්වයකි.

විශේෂාංග

# රජෙක් නොවූ රජෙකුගේ ජීවන දිග හැරුම



**දෙවන එලිසබෙත් රැජිනගේ සැමියා ලෙස 1947 වසරේදී ඇගේ අතිනත ගනිමින් පුරා අවුරුදු 70 ක් ඇයගේ දිවියේ සවිය ලෙස නිරතුරුවම රැඳී සිටි එඩින්බරෝ ආදිපාදවරයා වන පිලිප් කුමරු පසු ගිය අප්‍රේල් මස 9 වැනි දින අභාවප්‍රාප්තවීයි මිය යන විට ඔහුට අවුරුදු 99කි.**

පිලිප් කුමරු උපත ලබන්නේ 1921 ජුනි 10 වන දින ග්‍රීක කෝර්ෆු දූපතේදී ය. පිලිප්ගේ පියා ග්‍රීසියේ සහ



වයස අවුරුදු 1 දී ග්‍රීසියේ පිලිප් කුමරු

ඩෙන්මාර්කයේ ඇන්ඩෘ කුමරුය. ඔහුගේ මව, වික්ටෝරියා රැජිනගේ මිණිබිරිය වූ ඇලිස් කුමරියයි.

1922 දී ග්‍රීසියේ රජු වූ පිලිප්ගේ මාමා හට ග්‍රීක -තුර්කි යුද්ධයේ පරාජයෙන් පසු සිය සිහසුන අහිමි වීමත් සමඟම, එවකට හමුදාවේ සේවය කරමින් සිටි පිලිප්ගේ පියා හට ඊළඟ දශකය පැරිසියේ ගෙවන්නට සිදු විය. එය ඔවුන්ට අතිශය දුෂ්කර කාල පරිච්ඡේදයක් විය.

රාජකීයන්ගේ පෙළපතකින් පැවත එන පිලිප් කුමරු, 1940 ජනවාරි සිට දෙවන ලෝක යුද්ධයේ අවසානය දක්වා රාජකීය නාවික හමුදාවේ සේවය කළේය. පිලිප් කුමරු පාසැල් අධ්‍යාපනය අවසන් කළ පසු රාජකීය නාවික හමුදාවට බැඳී එංගලන්තයේ ඩාර්ට්මුත් හි රාජකීය නාවික විද්‍යාලයට ඇතුළත් වූයේ ඔහුගේ මාමා වන ලුවී මවුන්ට්බැටන් සාමිවරයාගේ උපදෙස් මතය.




1947 ජූලි 31 දින එංගලන්තයේ කෝර්ෂාම් පුහුණු මධ්‍යස්ථානයේ දී සිය කණ්ඩායම් නිරීක්ෂණය කරමින්

පිලිප් කුමරු හට ප්‍රථම වරට 13 හැවිරිදි එලිසබෙත් කුමරිය මුණගැසෙන්නේ ඔහු නාවික හමුදාවේ සේවයේ නිරත වන කාල වකවානුවේදීය. ඔවුන් දෙදෙනාම වික්ටෝරියා රැජිනගේ මුනුබුරු මිණිබිරියන් වීම හේතුවෙන්



හේතුවෙන් එලිසබෙත් කුමරිය ඔහුට නෑකමින් ඔහුගේ තුන්වන ඥාතී සහෝදරිය විය. ඔවුන්ගේ පළමු හමුවේදීම එලිසබෙත් කුමරිය පිලිප් කුමරු වෙත ආකර්ෂණය වූ බව කියැවේ.

එම පළමු හමුවෙන් අවුරුදු හතකට පසු, 1947 දී මෙම යුවළ ඔවුන්ගේ විවාහ ගිවිස ගැනීම පිළිබඳව ලොවට නිවේදනය කළහ. ඔවුන් දෙපළ නොවැම්බර් මාසයේ වෙස්ට්මිනිස්ටර් ඇබේහිදී විවාහ විය. 1947 වර්ෂයේ පෙබරවාරි 28 වන දින පිලිප් බ්‍රිතාන්‍ය ජාතිකයෙකු බවට පත් වූයේ ග්‍රීක සහ ඩෙන්මාර්ක සිංහාසන සඳහා ඇති සිය අයිතිය අත්හැර දමා ඔහුගේ මවගේ වාසගම වන මවුන්ට්බැටන් නාමය සිය නම අගට එක් කරගනිමිනි.

ඔහුගේ විවාහ දිනයේදී හයවන ජෝර්ජ් රජු විසින් ඔහු එඩින්බරෝ ආදිපාදවරයා, මෙරියොනෙත්හි අර්ල් සහ බැරන් ග්‍රීන්විච් ලෙස පත් කරන ලදී.



1948 වර්ෂයේ එලිසබෙත් කුමරිය හා ආදිපාදවරයා සිය පළමු දරුවා වූ චාල්ස් කුමරුගේ උපත සමරනු ලැබූ අතර 1950 වර්ෂයේදී ඔවුන් හට දියණියක් ලැබිණි.ඇය ඈන් කුමරියයි. ඉන් පසු 1960 වර්ෂයේ ඔවුන්ගේ තෙවන දරුවා වූ ඇන්ද්‍රෑ කුමරුගේ උපතත්, 1964 වර්ෂයේ දී එඩ්වර්ඩ් කුමරුගේ උපත සිදු විය.



ඔවුන්ගේ විවාහයෙන් අවුරුදු පහකට පසු, හයවන ජෝර්ජ් රජු වයස අවුරුදු 57 දී පිල්ප් සහ එලිසබත් කුමරිය අප්‍රිකානු චාරිකාවක නිරතව සිටුයදී සිටියදී මිය  යන අතර ඉන් අනතුරුව 25 හැවිරිදි ඔහුගේ බිරිඳ දෙවන එලිසබෙත් රැජින ලෙස සිංහාසනයට පත් විය. කුමරිය රැජින වූ විට පිලිප්ගේ ජීවිතයේ තවත් විශාල පෙරළියක් සිදු විය. රාජකීය ලේ ඇත්තෙකු ලෙස ඔහු ඉපදී හැදී වැඩුණේ මුළුමනින්ම පාහේ පුරුෂයන් විසින් රාජ්‍ය කළ ලොවකය. එනමුත් එක රැයකින් සහ සිය ජීවිත කාලය පුරාවට ඔහුට ඔහුගේ බිරිඳ වූ රැජිනට සහයෝගය දැක්වීම හා නිරතුරුවම ඇයට අඩියක් පසු පසින් ගමන් කිරීමට සිය ජීවිතයම කැප කිරීමට සිදු විය. ඔහුට ඇය වෙනුවෙන් නාවික හමුදාවේ තම රැකියාව අතහැර දැමීමට සිදු විය. එපමණක් නොව, ඇයගේ රාජාභිෂේකයේදී ඔහුට ඇය ඉදිරියේ දණ නැමීමට සිදු විය. ඔහුගේ දරුවන් හට ඔහුගේ පවුලේ නාමය වන මවුන්ට්බැටන් නාමය දැරීමට හැකි වුයේ නැත. නමුත් කළ යුතු කිසිවක් වුයේද නැත. එයට හේතු වුයේ ඔහු ඇගේ සැමියා වන විට ඇය ඔහුට මෙන්ම මුළු මහත් රාජ්‍යයකට රැජිනක් වීමයි.



පිලිප් කුමරු සිය ජීවිතය කැප කළේ සහායක භූමිකාවක් තුළ වුවද දෙවන එලිසබත් රැජින වෙනුවෙන් කැපවූ ස්වාමිපුරුෂයෙකු ලෙස කටයුතු කළ ඔහු, ඔහුගේ රාජකාරි කටයුතුවලදී ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේය. ඔහු ඉතා පෙරටුගාමී චින්තනයක් සහිත වුවෙක් ලෙස හැඳින්වේ. රාජකීය පවුලේ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් කළ පළමු සාමාජිකයා ආදිපාදවරයායි. ඒ 1961 මැයි මාසයේදී රිචඩ් ඩිම්බල්බි සමගින්ය. 2009 දී ඔහු බ්‍රිතාන්‍ය රාජකීය ඉතිහාසය තුළ දීර්ඝතම කාලයක් සේවය කළ රාජකීය සහකරු බවට පත් විය.

ආදිපාදවරයා සුදුසුකම් ලත් ගුවන් නියමුවෙකු වූ අතර පැය 5,986ක පියාසර කාලයක් සමග ගුවන් යානා වර්ග 59ක් පියාසර කිරීමේ පළපුරුද්ද ඇත්තෙක්ද වීම විශේෂත්වයකි.


පිලිප් කුමරු සිය බිරිඳ වූ එළිසබත් රැජින සමඟ ඇගේ පොදු රාජ්‍ය මණ්ඩලීය සංචාර සහ රාජ්‍ය චාරිකා සඳහා මෙන්ම එක්සත් රාජධානියේ සෑම ප්‍රදේශයකම පාහේ සිදු වූ කටයුතුවලට සහභාගී විය. දෙවන එලිසබෙත් රැජින සහ පිලිප් කුමරු  නිදහසින් පසු දෙවරක් ශ්‍රී ලංකාවට පැමිණියේය. ඒ පළමුව 1953 දී සහ 1981 දී ය.





පිලිප් කුමරුට අයත් අවුරුදු 90 ක් පමණ පැරණි මෝටර් රථයක් රාජකීය කෞතුක වස්තුවක් ලෙස ගාලු මුවදොර හෝටලයේ අද දැක ගත හැකිය. ඔහු 1940 වර්ෂයේදී දී බ්‍රිතාන්‍ය නාවික හමුදාවේ සේවය කරන අතර තුර කොළඹ සිටි කාලය තුළදී ඔහුගේ පළමු මෝටර් රථය පවුම් 12කට මිල දී ගත්තේය.

1950 දශකයේ මුල් භාගයේදී එඩින්බරෝ ආදිපාදවරයා කොළඹ ගාලු මුවදොර හෝටලයට පැමිණ ඔහු, මෝටර් රථය දුටු වහාම එය මිලදී ගැනීමට අවශ්‍ය වූ බවත් එහි තිරිංග හොඳින් ක්‍රියාත්මක වේ දැයි විමසූ බවටත් බ්‍රිතාන්‍ය මාධ්‍ය ආයතන වාර්තා කරයි.




පුරා වසර 73ක් දෙවන එලිසබත් රැජිනගේ "ශක්තිය සහ සේවනැල්ල" වූ එඩින්බරෝ ආදිපාදවරයා මිය යන විට 99 වියේ පසු විය.

*මාධවී රංගේබණ්ඩාර*
*මාධ්‍ය නිලධාරි*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

# කියුබාව ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන අඛණ්ඩ සහයෝගය පිළිබඳ ගරු කථානායකවරයා සිය කෘතවේදීත්වය පළකරයි



**කියුබාව ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන අඛණ්ඩ සහයෝගය පිළිබඳ සිය කෘතවේදීත්වය පළකර සිටින බවත් ඉදිරි අනාගතයේදීද දෙරට අතර මෙම සහයෝගීත්වය වර්ධනය වනු ඇතැයි තමා අපේක්ෂා කරන බවත් ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.**

කථානායකවරයා මේ බව පවසා සිටියේ ශ්‍රී ලංකා කියුබානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ 9 වැනි පාර්ලිමේන්තුව සඳහා නව නිලධාරී මඩුල්ලක් පත්කර ගැනීම වෙනුවෙන් පැවැත්වූ විශේෂ රැස්වීමේදීය. ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනිය වන යුවාන් එලීනා මහත්මියද අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

පවතින කොවිඩ් වසංගත තත්ත්වය තුළ හයිටි රාජ්‍යයේ රැඳී සිටින ශ්‍රී ලාංකේය ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත වෛද්‍ය කණ්ඩායමක් යැවීම සම්බන්ධයෙන් කථානායකවරයා මෙහිදී සිය ස්තූතිය කියුබානු රජය වෙත පළ කළේය.

මෙහිදී අදහස් දැක්වූ කථානායකවරයා " කියුබානු වෛද්‍යවරු ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සුවිසල් දායකත්වයක් ලබා දී ඇති බව මෙහිදී සඳහන් කිරීමට අමතක නොකළ යුතුයි. ඔවුන් වසර ගණනාවක් තිස්සේ අම්පාර සහ අනුරාධපුර රෝහල්වල සේවය කර ඇති අතර 2004 දී සුනාමියේ ව්‍යසනය අතරතුරදී ඔවුන් නැවත ශ්‍රී ලංකාවේ පීඩාවට පත් ප්‍රජාවට උපකාර කිරීමට ඉදිරිපත් විය. මෙම මිත්‍රත්ව සංගමය අපේ රටවල් දෙක සහ එහි ජනතාව අතර පවතින දිගුකාලීන මිත්‍රත්වයට සහ සහෝදරත්වයට වැඩි අවස්ථාවක් එක් කරනු ඇතැයි මම අපේක්ෂා කරමි". යැයිද පැවසීය.

මෙහිදී නව වැනි පාර්ලිමේන්තුවට අදාළව ශ්‍රී ලංකා කියුබානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව සභාපතිවරයා ලෙස මහාචාර්ය තිස්ස විතාරණ මහතා ද ලේකම්වරයා වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී මොහොමඩ් මුසම්මිල් මහතාද තේරී පත්විය.

උප සභාපතිවරු වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන වීරසුමන වීරසිංහ, සාගර කාරියවසම් සහ අරවින්ද් කුමාර් යන මහත්වරුද භාණ්ඩාගාරික ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. සී. අලවතුවල මහතාද උපලේකම් ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රිනී ආචාර්ය හරිනි අමරසූරිය මෙනවියද තේරී පත් විය.





# 2021 වසරේදී ක්‍රීඩකයන් භාවිත නොකළ යුතු යැයි නම් කළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව පාර්ලිමේන්තුවට

ලෝක උත්තේජන මර්දන නියෝජ්‍යායතනය විසින් 2021 වර්ෂයේදී විවිධ ක්‍රීඩාවන් සඳහා හඳුන්වාදෙනු ලැබූ තහනම් උත්තේජක ඇතුළු තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව 21දා පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කළේය. තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මහතා විසින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

විශේෂයෙන් වාර්ෂිකව ලෝක උත්තේජන මර්දන නියෝජ්‍යායතනය විසින් විවිධ ක්‍රීඩාවන් සඳහා තහනම් උත්තේජක ද්‍රව්‍ය ලෙස නම්කරන ලැයිස්තුවක් නිකුත් කරන අතර නොදැනුවත්ව හෝ ක්‍රීඩකයන් මෙම ද්‍රව්‍යන් තම කුසලතා වර්ධනය සඳහා භාවිත කිරීම ඔවුන් එම තරඟ ඉසව්වේ තහනමට ලක්වීමට හෝ වෙනයම් ක්‍රියාමාර්ගයකට යොමු කිරීමට හේතුවක් වේ.

මේ අනුව 2021 වර්ෂයේ ජනවාරි 01 දින සිට මෙම වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වලංගු වන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව මෙසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. ඊට අදාළ ගැසට් නිවේදනය පසුගිය පෙබරවාරි 23 වෙනිදා නිකුත්කොට තිබුණි.


## කර්තෘ මණ්ඩලය

උපදේශනය
ධම්මික දසනායක මහතා
(පාර්ලිමේන්තු මහලේකම්)

කුෂාණි රෝහණධීර මහත්මිය
(නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලය ප්‍රධානී)

ටිකිරි කේ. ජයතිලක මහතා
(සහකාර මහලේකම්)

සංකල්පය හා මඟපෙන්වීම
ශාන් විජේතුංග මහතා

ප්‍රධාන සංස්කරණය
බුද්ධිනි රාමනායක මෙනෙවිය
එදිරිවීර ගුණසේකර මහතා
නිම්මි හාතියල්දේණිය මහත්මිය

සහාය සංස්කරණය
මහේෂ්වරන් පිරසාද් මහතා
රිෂ්මියා නුටාන් මහත්මිය

ඡායාරූපකරණය
නුවන් දුමින්ද මහතා

පිටු සැලසුම්කරණය
ඉෂාරා වික්‍රමසිංහ මෙනෙවිය

අන්තර්ජාලය හරහා බෙදාහැරීම
ඒ. ජී. එම්. එම්. නුස්කි මහතා

# නිලධර විත්ති



**එම්. යූ. එම්. වාසික් මයා**

සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)- මන්ත්‍රී සේවා කාර්යාංශය

පරිපාලන දෙපාර්තමේන්තුව

වැලිගම අරෆා ජාතික පාසැලෙන් මූලික අධ්‍යාපනය ලැබූ එම්. යූ. එම්. වාසික් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකි.

පාර්ලිමේන්තු නිලධාරිවරයෙකු ලෙස 1993 වසරේදී පාර්ලිමේන්තුවට පැමිණෙන වාසික් මහතා සභාලේඛන කාර්යංශය, පනත් කෙටුම්පත් කාර්යංශය, උපදේශක කාරකසභා කාර්යංශය සහ මන්ත්‍රී සේවා කාර්යංශය තුළ සේවය කර තිබේ. ඔහුගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 29කි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අත්දැකීම් බහුල නිලධාරියෙකු වන එම්.යූ.එම්.වාසික් මහතා මේ වන විට මන්ත්‍රී සේවා කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරමින් සිටියි.

ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අදාළව දෙස් විදෙස් පුහුණු වැඩමුළු රැසකටද වාසික් මහතා සහභාගී වී තිබීම විශේෂත්වයකි.



**සුදත් පෙරේරා මයා**

සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ලේකම් - අමාත්‍යාංශයීය

උපදේශක කාරක සභා

පරිපාලන දෙපාර්තමේන්තුව

රාගම බටුවත්ත කණිෂ්ඨ විද්‍යාලයෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ සුදත් පෙරේරා මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා විශේෂ උපාධිධාරියෙකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ විවෘත විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙසද හෙතෙම කලක් කටයුතු කර තිබේ.

පාර්ලිමේන්තු නිලධාරියෙකු ලෙස 1994 වසරේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පැමිණෙන ඔහු ආයතන කාර්යංශය, සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මුදල් හා ගිණුම් කාර්යංශය, කාරක සභා කාර්යංශය, අභ්‍යන්තර විගණක කාර්යාලය, සැපයුම් හා සේවා කාර්යංශය සහ මන්ත්‍රී සේවා කාර්යංශය තුළ සේවය කර ඇත.

ඉන්දියාව, මහා බ්‍රිතාන්‍ය ආදී රටවල් කිහිපයකම ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අදාළව පුහුණු වැඩමුළු රැසකට සහභාගී වී ඇති සුදත් පෙරේරා මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ සිටින අත්දැකීම් බහුල නිලධාරියෙකි.

ඔහු මේ වන විට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවන්හි ලේකම්වරයා ලෙසද කටයුතු කරමින් සිටියි.

පාර්ලිමේන්තු

ඡායා ගැලරිය

# කථානායකතුමා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තර කරයි

**පලස්තීනය** සමඟ මිත්‍ර සබඳතා තර කරමින්...





**කියුබාව** සමඟ මිත්‍ර සබඳතා තර කරමින්...





**කුවේට් රාජ්‍යය** සමඟ මිත්‍ර සබඳතා තර කරමින්...







**රුසියාව** සමඟ මිත්‍ර සබඳතා තර කරමින්...





පාර්ලිමේන්තු විත්ති
පුවත් හසුන සඳහා දායක
වීමට ඔබටත් අවස්ථාව...,
“පාර්ලිමේන්තුව” තේමා
කරගත් මාතෘකා ඔස්සේ
ලිපි සම්පාදනයට ඔබටත්
අවස්ථාව පවතී.

සියලු ලිපි සෑම මසකම
15 වැනිදාට පෙර පහත
ඊමේල් ලිපිනයට යොමු
කරන්න.

sriparliament@gmail.com
විමසීම් - 0112 777 328

සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka
@ParliamentLK
@slparliament
Parliament of Sri Lanka